# හිමාෂි සහ මැජික් පැන්සල



ඊ.එම්.ඒ.ජී. හිමාෂි සදෙව්මි ඒකනායක

# හිමාෂි සහ මැජික් පැන්සල


## ඊ.එම්.ඒ.ජී. හිමාෂි සදෙව්මි ඒකනායක


කතෘගේ වෙනත් කෘති

- තුන් ඉරි අප්පු 2023
- අනෝදා මල 2024


මහ/මහාමායා බාලිකා විදුහල

5 A



2026.04.16

ISBN 978-624-211-084-4

# පිදුම

මාහට

අකුරු කරවූ

සියළු ගුරු මැණිවරුන්ට

මෙය

පූජෝපහාරයක්

වේවා........



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකියි දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකී මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී එහි ප්‍රතිපලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර හු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයී මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එක්තරා ලස්සන ගමක හිමාෂි කියලා හරිම ලස්සන දක්ෂ දියණියක් හිටියා. හිමාෂි චිත්‍රා ඇඳීම නැටුම් නටන්න ගීත ගයන්න හා ඉගෙන ගන්න හරිම දක්ෂයි. හිමාෂිට ලස්සනට චිත්‍ර අඳින්නත් පුළුවන්. එයාගේ ගමේ ලස්සනට චිත්‍ර අඳින්න පුළුවන් තව ළමයින් හිටියත් ඒත් ඒ අයට චිත්‍ර අඳින්න අවශ්‍ය පැන් පැන්සල් පාට කොළ වර්ග ආදී තිබුණේ ටිකක් අඩුවෙන්

එක දවසක් හිමාෂි පාසල් ඇරී ගෙදර එනකොට පාර අයිනේ තිබිලා දිලිසෙන නිල් පැන්සලක් හම්බ වුණා.



ඉතින් හිමාෂි මේ නිල් පාට පැන්සල අරන් ගෙදර ගිහින් ඇපල් ගෙඩියක් ඇන්දා හරි පුදුමයි. ඇපල් ගෙඩිය ඇදලා ඉවර වෙන විටම පුදුමයකි. ඒ ඇපල් ගෙඩිය කොලෙන් එළියට මතුවෙලා සැබෑ ඇපල් ගෙඩියක් බවට පත්වුණා. හිමාෂි පුදුමයෙන් එය අතට ගෙන හොඳින් බැලුවා.



හිමාෂිට තේරුනා මේ පැන්සල නිකම්ම නිකන් පැන්සලක් නෙමෙයි කියලා. හිමාෂිට ඕන වුණා මේ පන්සලෙන් තමන්ට ඕන ලස්සන ඇඳුම් පැළඳුම් සෙල්ලම් බඩු එහෙම ඇදලා ලබාගන්න.

හිමාෂිට ඒත් සමඟම හිතුනා තමන් ගැන නෙමෙයි. හැමෝටම මේ පැන්සලෙන් උදව් කරන්න තිබුනානම් හොඳයි කියලා.



හිමෂි පසුදා පාසලට ගියේ ලොකු බලාපොරොත්තුවක් හිතේ තබාගෙනය. හිමාෂි එයාගේ පාසලේ සෙල්ලම් මිදුල ළඟට අර නිල් පාට පැන්සලත් අරගෙන ගියා.

එයා දැක්කා සෙල්ලම් මිදුලේ ඔන්චිල්ලාව කැඩිලා තියෙනවා. ඉතින් හිමාෂි ලස්සන ඔන්චිල්ලාවකුයි සීසෝවකුයි අර නිල් පාට පැන්සලෙන් ඇන්දා. ඒවා සැබෑ සෙල්ලම් බඩු බවට පත්වුනා.



හිමාෂි ඉන්පසු තමන්ගේ පන්සලත් රැගෙන ළමයි ළඟට ගියා. චිත්‍ර අඳින්න කොළ පැන්සල් පාට නැති ළමයි හට එයා කොළයක ඒ උපකරණ ඇන්දා. අකුරු ලියන්නට පොත් නැති අයට ඒවා ඇන්දා. ඒවා ඒත් සමගම මතු වුණා.



එයාට හිතුනා මේ පාර දෙපස ලස්සනට විදුලි ලාම්පු ටිකක් සවි කරන්න හිමාෂි පාර අයිනේ ලස්සන විදුලි ලාම්පු කිහිපයක් ඇන්දා. ඒවා අලංකාර විදුලි ලාම්පු බවට පත්වුණා.




ටික දිනක් ගෙවී ගියා මේ මැජික් පැන්සල ටික ටික කෙටි වී අවසන් වුණා.

හිමාෂිට ආපහු අලුත් දේවල් මවන්න බැරි වුණා.



හැබැයි හිමාෂි දුක් උනේ නෑ මොකද එතකොට එයාගේ ගම සහ පාසල අලංකාර තත්ත්වයකට පත්වී තිබූ නිසා දිනක් හිමාෂිට ගමේ හැමෝම එකතුවෙලා ස්තුතියි කරන උත්සවයක් පවත්වද්දී විදුහල්පතිතුමිය මෙහෙම කිව්වා.



“හිමාෂි ළඟ තිබුනේ මැජික් පැන්සලක් විතරක් නෙමෙයි. අනුන්ට උදව් කරන්න පෙළඹෙන මැජික් එකක් වගේ ලස්සන හදවතක් සැබෑ වීරත්වය කියන්නේ තමන්ට ලැබෙන දේ අනුන් වෙනුවෙන් කැප කිරීමයි. හිමාෂි තියෙන වගේ අපට යම් විශේෂ හැකියාවක් හෝ වාසනාවක් ලැබුණ විට එය තමාගේ ප්‍රයෝජනයට පමණක් යොදා නොගෙන පොදු යහපත උදෙසා යොදා ගැනීමට සැබෑ දක්ෂතාවයක් බව” විදුහල්පතිතුමිය හිමාෂිට ප්‍රශංසා කළාය. එදා සිට මේ ගමේ හැමෝම හිමාෂිට ආදරය කරන පුංචි වීරවරියක් වුණා.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **'හේමමාලා උපහාර'** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)